

''.. හැම දේම වෙන්නෙ අපට ඕනෙ විදිහට නෙවෙයි.. කොහේදෝ කවුරුදෝ තීරණය කළ විදිහකට.. '' යි කියන්නට අනුරාධට සිතුණි. ඒ සත්‍යය තේරුම් ගන්නට දිලීපට හැකි වේ දැයි සිතන්නට අනුරාධට නොහැකි ය.

දිලීප නිහඬවම වාහනය ඉදිරියට ගත්තේ ය.

අනුරාධ ගේ නවාතැන ඉදිරියේ වාහනය නවත්වන තුරු එකම එක වදනදු ඔහු මුවින් පිට නොවුණි. අනුරාධ බැස ගත් පසු එකම වතාවක් හෝ ඔහු දෙස නොබැලූ දිලීප වාහනය පණ ගන්වා ඉදිරියට ගත්තේ ය. දිලීප ගේ රිය නොපෙනී යන තෙක් බලා සිටි අනුරාධ ආපසු හැරුණේ මහා බරක් හිස තබා ගත්තකු සේ ය.

000000

අනුරාධ ගේ උරහිසෙහි සිය හිස තබාගත් නිෂාදි බොහෝ වේලාවක් හඬා වැටුණා ය. ඇය වළක්වන්නට ඔහු උත්සාහ නොකළේ ය. ඔහු ඇගේ හිස සෙමින් පිරිමදිමින් සිටියේ ඇගේ සිත සැදිමට කියන්නට යමක් නොමැති වූ කලෙක මෙනි.

''ඔයා ඉක්මණට ආපහු යන්න ඕනෙ.. '' නිෂාදි මුමුණනු ඔහුට ඇසුණි.

''එතකොට ඔයා..?'' ඔහු ඇසුවේ ය.

''ම.. මං ගැන හිතන්න එපා .. මට මෙහෙම බයෙන් ඉන්න බැහැ දෙයියනේ.. මට ඔයා ගැන බයයි.. ඔයා මෙහේ ඉන්න හැම දවසක්ම හැම පැයක් ම මගේ හිතට බරක්..''

අනුරාධ සීරුවෙන් ඇගේ හිස සිප ගත්තේ ය.

''මට ඔයා දාලා යන්න බැහැ නිෂා..''

නිෂාධී හිස ඔසවා ඔහු දෙස බැලුවා ය. ඔහු ගේ දෑස් කඳුළින් පිරී තිබෙණු ඕ දුටුවා ය. ඔහු ගේ සුරත සෙමින් අල්ලාගත් නිෂාධී එය සිය කුස මත තබා ගත්තාය.

''දැනෙනවද..?'' ඕ පහත් හඬින් ඇසුවා ය. ''.. දැනෙනවද අපේ පැටියා කලබල වෙලා ඉන්න හැටි.. තේරෙනවද එයා මොනාද මේ කියන්නෙ කියලා.. එයා තාත්තට කියනවා ඉක්මණට ආපහු යන්න කියලා.. එයා ඉක්මණට ම එන්නම්ලු තාත්තව බලන්න.. තාත්තගෙ අතේ එල්ලිලා නුවර වැව වටේ ඇවිදින්න යන්න.. තාත්තත් එක්ක මාළිගාවට ගිහිල්ලා නිල් මානෙල් මලක් පූජා කරලා එන්න.. ''

අනුරාධ කඳුලු අතරින්ම සිනාසුණේ ය.

''එතකොට අම්මා..?'' ඔහු ඇසුවේ ය.

''අම්මා නේද...? ම්.... ම්....''

''ඔව්... කියන්න බලන්න''

''ම්... ම්..... අම්මා නේද...? අම්මත් එනවනේ තාත්ත ගේ අනිත් අතේ එල්ලිලා..''

කප්පරක් සිහින පොදි
තුරුළු කොට ගෙන හදේ
කප්පරක් දුක් විඳිමි
කඳුළු සඟවන් නෙතේ
කප්පරක් සුසුම් මළු
දවා අළු කර සිතේ
කප්පරක් දුර ගෙවමි
නුඹ දැක ගෙන මෙසේ

*- තාරකා විජිතය නිමයි -*

## ජගත් ජේ එදිරිසිංහ ලියන

# තාරකා විජිතය

